# දේශගුණ විපර්යාස සහ එහි සමාජීය බලපෑම

**චලනි රූබසිංහ**

**පරිසර නිලධාරිනී, පරිසර යුක්ති කේන්ද්‍රය**

"මේ දවස්වල පුදුම රස්නයක් තියෙන්නෙ.."
"ඔව් අනේ.. දවල්ට එළියට බහින්න බෑ ගිනි අව්ව, ගේ ඇතුලෙ හිටියත් දාඩිය දානව"
"ඉස්සර නම් මේ කාලෙට වැස්ස, දැන් හොඳටම ඉඩෝරෙ"

මේ අපට නිතර ඇසෙන දෙබස් කාණ්ඩයයි.

සැබවින්ම දේශගුණික විපර්යාස යනු මොනවාද?

පෘථිවියේ සාමාන්‍ය දේශගුණික රටාවල ඇතිවන වෙනස්කම් දේශගුණික විපර්යාස ලෙස සැලකේ. උදාහරණ ලෙස, ඍතු විපර්යාස සාමාන්‍ය දේශගුණික රටාවක් වන අතර මේවායේ සාමාන්‍ය ලක්ෂණ වල ඇතිවන වෙනස්කම් දේශගුණික විපර්යාසයි. ප්‍රධාන වශයෙන් මෙයට පෘථිවිය මත උෂ්ණත්වයේ ඇති වන වෙනස බලපායි.

පෘථිවිය මත උෂ්ණත්වය ඉහළ යාම කෙරෙහි හරිතාගාර වායු විමෝචනය සෘජුව බලපායි. හරිතාගාර වායු යනු අධෝරක්ත කිරණ උරා ගැනීමට හා විමෝචනය කිරීමට සමත් වායූන් ය. හරිතාගාර වායු අතරට කාබන් ඩයොක්සයිඩ්, මීතේන්, නයිට්‍රස් ඔක්සයිඩ්, ඕසෝන්, ක්ලෝරෝ ෆ්ලූරෝ කාබන් හා ජල වාෂ්ප අයත් වේ. හරිතාගාර වායූන් විශාල ලෙස පරිසරයට නිකුත් වීම කෙරෙහි සෘජු සහ වක්‍ර ලෙස මිනිස් ක්‍රියාකාරකම් විශාල වශයෙන් දායක වේ.

පෘථිවිය මත උෂ්ණත්වය ඉහළ යාම හා දේශගුණික විපර්යාස නිසා සිදුවන අයිස් දියවීම, මුහුද ආම්ලීකරණය, අස්වැන්න අඩුවීම හෝ විනාශවීම, මුහුදු මට්ටම ඉහළ යාම, ලෙඩ රෝග පැතිරීම, උන්හිටි තැන් අහිමි වීම, ජෛව විශේෂ විනාශ වීම, ගංවතුර, සුළිසුළං, නාය යාම් වැඩි වීම ආදිය සංවර්ධන අංශයන්ට, මිනිස් ගහනයට, යටිතල පහසුකම් වලට හා පරිසර පද්ධති වලට විශාල ලෙස බලපෑම් ඇති කිරීමට හේතු වී ඇත.

මෙලෙස දේශගුණික විපර්යාස සිදුවීම උග්‍ර ලෙස බලපාන්නේ ජීවනෝපාය සඳහා ස්වභාවික පරිසරය හා එහි රටා මත යැපෙන පුද්ගලයන් කෙරෙහිය. උදාහරණ වශයෙන් ගොවීන්, ධීවරයන්, කුඩා දූපත් වාසීන් දැක්විය හැක. සාමාන්‍ය ජනයා දේශගුණික විපර්යාස යන්න නොදැන සිටියද එහි බලපෑම අත්විඳ ඇත.

පරිසර යුක්ති කේන්ද්‍රය මේ පිළිබඳව සමීක්ෂණ කිහිපයක් පවත්වා ඇති අතර ඒ අනුව විවිධ පුද්ගලයන් දේශගුණ විපර්යාස දකින අයුරු හා එමගින් ඔවුන්ට ඇති බලපෑම පිළිබඳ තොරතුරු එක් රැස් කරන ලදී.

වගා ක්ෂේත්‍රයට දේශගුණ විපර්යාස කොහෙත්ම හිතකර නොවේ. උදාහරණ වශයෙන් 1970 වර්ෂ වල සුළි සුළං හේතුවෙන් නුවර එළියේ පෙයාර්ස් වගාව සම්පූර්ණයෙන් විනාශ වීමත්, වියළි කලාපයේ වාණිජ කෘෂිකාර්මික ප්‍රදේශ වල වෙනස්වන සුළු වර්ෂාපතනය නිසා එක් ඍතුවකදී පමණක් වගා කල හැකි බැවින් අස්වැන්න අඩුවීමත් දැකිය හැක. වගාවට අහිතකර තත්ත්වයන් පවතින කාලවලදී ඇතැම් ගොවීන් විකල්ප රැකියා/කම්කරු වෘත්තීන් වල නියැලේ. එසේම පසුගිය දශක කීපය තුලදී වගා කල ඉඩම් ප්‍රමාණය අඩු වී ඇත. නියමිත කාල වලදී අධික වර්ෂාපතනය හෝ ජලය හිඟකම නිසා ඇතැම් ප්‍රදේශ වල වගා බිම් අතහැර දමා ඇති අතර ඇතැම් තැනක වී ගොවිතැන වෙනුවට එළවළු වගාව සිදු කරයි.

ධීවරයන් මුහුණ දෙන ගැටළු අතර ප්‍රධාන වන්නේ කුණාටු සුළි සුළං හේතුවෙන් මුහුදු යාමට හිතකර කාල වකවානු අඩු වීම හා ඒ නිසා මත්ස්‍ය එළදාව ලබා ගැනීම අවම වීමයි.

බොහෝ පුද්ගලයන් සඳහන් කරන ලද්දේ මෑත දශක වලදී දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන ආපදා විශාල වශයෙන් වැඩි වී ඇති බවයි. උදාහරණ ලෙස සුළඟ නිසා නිවාස අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් අබලන් වීමත් ගංවතුර හේතුවෙන් උස්බිම් වලට යාමට සිදුවීමත් දැක්විය හැක. මේ නිසා ස්වභාවික ආපදා නිසා අවතැන් වන පුද්ගලයන් සංඛ්‍යාව ද මේ වන විට ඉහළ යමින් පවතී.

ඇතැම් තැනෙක බීමට ජලය ගත් ලිඳෙහි මේ වන විට කට සේදීමට වත් නොහැකි තරමට ජලය කිවුල් රස වී ඇත. මෙය හුදෙක් ජල ගැටළුවක්ම පමණක් නොව මේ වන විට සෞඛ්‍ය ගැටළුවක් බවට ද පත් වෙමින් තිබේ.

එසේම වායුගෝලීය උෂ්ණත්වය වැඩිවීම නිසා සම කැසීම, කුෂ්ඨ රෝග සහ දැවෙන සුළු සංවේදනයන් ඇතිවීම ද සාමාන්‍ය ජනයා මුහුණ දෙන ගැටළු අතර වේ. නුවරඑළිය ප්‍රදේශයේ ජනයාගේ අදහස් වලට අනුව, පසුගිය කාල වකවානුව තුලදී නුවරඑළියේ මීදුම හා සීතල අඩු වී ඇති බවත්, මුලින් නොවැම්බර් හා දෙසැම්බර් කාල වලදී පැවති තද මීදුම මේ වන විට ජනවාරි හා දෙසැම්බර් මුල දක්වා වෙනස් වී ඇති බවත් සඳහන් කෙරිනි. එසේම දැන් දැන් නුවරඑළිය ප්‍රදේශයේ මදුරුවන් හා මැස්සන් වැඩි වී තිබේ. සුළගේ වේගය මෙන්ම රටාව ද වෙනස් වී ඇත. පානය කිරීමට නොහැකි තරම් සීතලව පැවති ඇළ දොළවල හා ගංගා ජලය දැන් තරමක් උණුසුම් ය. පසුගිය දශක කිහිපය තුල සර්පයන් ද බහුල විය.

ලෝක මතයට අනුව දේශගුණික විපර්යාස හේතුවෙන් ආසියාතික ජනයා මුහුණ දෙන ප්‍රධාන ගැටළුව වන්නේ මුහුදු මට්ටම ඉහළ යාමයි. එසේම ජලය හිඟ වීම හා උෂ්ණත්වය ඉහළ යාම නිසා වී වගා කල හැකි කාල සීමාව අඩුවීම හේතුවෙන් වී අස්වැන්න අඩු වීම තවත් ගැටළුවකි. මේ හේතුවෙන් වර්ෂ 2070 වන විට මිලියන 139ක් පමණ වන ජනයා, දශකයකට වරක් වත් ආහාර හිඟවීමකට මුහුණ දෙනු ඇතැයි ජාත්‍යන්තර දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC) අනාවැකි පළ කරයි.

දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා සාමාන්‍ය ජනයාගේ දායකත්වය ද මෙහිදී සලකා බැලීම වටී. මේ සඳහා,

- ✓ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම
- ✓ කාබන් විමෝචනය අවම කෙරෙන බලශක්ති ප්‍රභව භාවිතා කිරීම
- ✓ වන වගාව ප්‍රචලිත කිරීම
- ✓ හැකි තාක් ස්වභාවික ආලෝකය ප්‍රයෝජනයට ගැනීම සිදුකල හැක.

වායුගෝලය තුළ ඉහළ නගින සෑම කාබන් ඩයොක්සයිඩ් මිලියනයට කොටස් 45කටම වායුගෝලයේ උෂ්ණත්වය ඉහළ යාම සෙල්සියස් අංශක 0.4ක් වේ. මේ නිසා වායුගෝලයට විමෝචනය කරන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය හැකිතාක් දුරට අවම කරගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

දේශගුණ විපර්යාස යනු හුදෙක් කතා බහක් පමණක් නොවේ. මේ වන විටත් අප ඊට මුහුණ දෙමින් සිටින අතර අදාල ක්‍රියා මාර්ග නොගත හොත් මිනිසා විසින්ම මිනිසාගේ විනාශය ඉක්මන් කර ගනු ඇත.